*සැ. යු.* -   මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.
2011.07.29 දින පළ වූ අංක 1717 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොවීය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,718 - 2011 අගෝස්තු මස 05 වැනි සිකුරාදා - 2011.08.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1034 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1040 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 අගෝස්තු මස 12 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 ජූලි මස 29 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

### කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව

කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවාගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. (කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන්ට හා දැනටමත් තාවකාලික, අනියම් හා ආදේශක සේවයේ නියුතු අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.).

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් සම්පූර්ණ කර "ලේකම්, කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව, ගොතටුව නව නගරය" යන ලිපිනයට 2011.08.12 වැනි දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

| අනු අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | සෞඛ්‍ය කම්කරු III | 01 | PL I-2006A<br>රු. 11,730-10x120-10x130 - 10x145 - 12 x 160 -රු. 17,600<br>(2 වැනි වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) | අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ. |
| 02 | ඖෂධ සංයෝජක | 01 | PL I -2006A(I ආරම්භක පියවර)<br>රු. 11,730-10x120-10x130 - 10x145 - 12 x 160 -රු. 17,600<br>(3 වැනි වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි | ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී අංක ගණිතය/ශුද්ධ ගණිතය වාණිජ අංක ගණිතය/ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව කඩඉමකි) විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබීම;<br>නැතහොත්<br>ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයෙන් එකම වතාවකදී ගණිතය, සිංහල/දෙමළ භාෂාව ඇතුලුව විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබීම;<br>සහ<br>රජයේ ආයුර්වේද බෙහෙත් ශාලාවක හෝ පිළිගත් රජයේ ලියාපදිංචි ආයුර්වේද බෙහෙත් ශාලාවක කිසියම් තනතුරක වසරකට නොඅඩු කාලයක සේවා පළපුරුද්ද ලබා තිබීම. |
| 03 | රියැදුරු II "ආ" | 01 | PL 3 -2006A<br>රු. 12,470 - 10 x 130 -10 x 145 - 10x160 - 12 x 170 -රු. 18,860<br>(3 වැනි වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසලකින් 08 ශ්‍රේණිය සමත් වී තිබිය යුතුය.<br>*වෘත්තීය සුදුසුකම් :*<br>පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොණ්ඩර විසිහතරකට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකය ලබා තිබිය යුතුය. (බඳවා ගන්නා ලද දිනට වසර 03කට පෙර අදාළ සහතික ලබා තිබිය යුතුය.);<br>වාහන රියැදුරෙකු වශයෙන් වසර 03ක පළපුරුද්ද (සහතික මගින් සනාථ කළ යුතුය.);<br>අවම උස අඩි 5 අඟල් 2 1/2 ක් තිබිය යුතුය ;<br>දිවා රාත්‍රී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයේ සිටිය යුතු අතර, මනා දෑස් පෙනීමක් තිබිය යුතුය ;<br>මාර්ග නීති පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය; |
| 04 | සුළු පරිපාලක (මාර්ග) | 01 | MN 1-2006A<br>රු. 13,120-10x145-11x170 10x 240 - 10 x 320 - රු. 22,040<br>(2 වැනි වැටුප් පියවරේ සිට කාර්යක්ෂමතා කඩඉමකි) | ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී අංක ගණිතය/ශුද්ධ ගණිතය/වාණිජ අංක ගණිතය/ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන සහිතව විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබීම |

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| | | | | හෝ<br>ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයෙන් එකම වතාවක දී ගණිතය, සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබීම;<br>හෝ<br>පළාත් පාලන ආයතනයක අවුරුදු 10කට නොඅඩු අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම්, 8 වැනි පන්තිය සමත්ව තිබීම; |

*02. බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

01. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
02. අයදුම්කරු බස්නාහිර පළාත තුළ අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වසර 03 ක කාලයක් ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.
03. අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය. (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයකු සම්බන්ධයෙන් උපරිම වයස් කාණ්ඩ බල නොපානු ඇත. )
04. අයදුම්කරු මනා සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතු ය.
05. සේවා අවශ්‍යතාවය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයන් හා ලිඛිත පරීක්ෂණයන් මගින් සුදුස්සන් තෝරනු ලැබේ.

*03. සේවා නියුක්ත කිරීමේ කොන්දේසි :*

01. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
02. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.
03. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසි වලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, බස්නාහිර පළාත් සභාවේ හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව විසින් වරින්වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතු ය :

1. උප්පැන්න සහතිකය ;
2. අධ්‍යාපන සහතික ;
3. පදිංචිය සනාථ කිරීමේ සහතිකය ;
4. මෑතක දී ලබාගත් ග්‍රාම සේවා සහතිකය ;
5. මෑතක දී ලබාගත් චරිත සහතික 02ක් ;
6. වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික ;
7. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික.

*04. අයදුම්කළ යුතු ආකාරය :*

1. මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි (A 4 ප්‍රමාණයේ) අයදුම්පතක් 2011.08.12 වැනි දින පෙර "ලේකම්, කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව, ගොතටුව නව නගරය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.
2. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතු ය.
3. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියාගේ නිර්දේශයන් සහිතව එවිය යුතු ය.
4. අතින් ගෙනැවිත් භාර දෙන අයදුම්පත් භාරගනු නොලබන අතර, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සැළකිය යුතුයි :* මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

වසන්ති වික්‍රමරත්න,
ලේකම් *(වැ.බ.)*,
කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව.

2011 ජූලි මස 18 වැනි දින,
ගොතටුව නව නගරය,
කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

*කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව*

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ...............................................තනතුර සඳහා බඳවා ගැනීම*

1. (අ) මුලකුරු සමග නම :——————————.
   (ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————.
2. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————.
3. ස්ථිර ලිපිනය :——————————.
4. (අ) ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද ? :——————————.
   (ආ) එසේ නම් පරම්පරාවෙන් ද ? ලියාපදිංචිවීමෙන් ද? :——————————.
5. ජාතික හැඳුනුම්පත් අංකය :——————————.
6. ස්ත්‍රී /පුරුෂ භාවය :——————————.
7. විවාහක/අවිවාහක තත්ත්වය :——————————.
8. දුරකථන අංකය :——————————.
9. උපන් දිනය :
   වර්ෂය :——————————, මාසය :——————————, දිනය :——————————.
10. 2011.08.12 වැනි දිනට වයස :
    අවුරුදු :——————————, මාස :——————————, දින :——————————.
11. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර):——————————,
12. වෘත්තීය සුදුසුකම් :——————————,
13. සේවා පළපුරුද්ද:——————————.
14. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියේ වරදකරුවකු කරනු ලැබ තිබේ ද ?:——————————.
15. දැනට ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු නම් ඒ පිළිබඳ විස්තර :——————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බවට ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

*දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

මෙම අයදුම්කරු වන ........................................................................... මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ................................................ වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය මොනයම් ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි./නොකරමි.

——————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :——————————,
පදවි නාමය :——————————,
දෙපාර්තමේන්තුව/ආයතනය :——————————,
(නිල මුද්‍රාව යොදන්න.)
දිනය :——————————.

08-88

## බදුල්ල මහ නගර සභාව

බදුල්ල මහ නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා නියමිත සුදුසුකම් ඇති බදුල්ල මහ නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *මාසික වැටුප* | *අවම අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| මාර්ග කම්කරු | 01 | රු.11,730-10x120- 10x130 - 10x145 - 12x160- රු.17,600 | අටවැනි ශ්‍රේණිය (නවවැනි වසර) සමත්ව තිබිය යුතු ය. |
| සෞඛ්‍ය කම්කරු | 07 | රු.11,730-10x120- 10x130 - 10x145 - 12x160- රු.17,600 | අටවැනි ශ්‍රේණිය (නවවැනි වසර) සමත්ව තිබිය යුතු ය. |
| විදුලි කම්කරු | 01 | රු.11,730-10x120- 10x130 - 10x145 - 12x160- රු.17,600 | අටවැනි ශ්‍රේණිය (නවවැනි වසර) සමත්ව තිබිය යුතු ය. |
| ආරක්ෂක නිලධාරි | 01 | රු.11,730-10x120- 10x130 - 10x145 - 12x160- රු.17,600 | අ.පො.ස(සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාරයකදී සිංහල/ගණිතය විෂයයන්ද ඇතුලුව විෂයයන් 06ක් සමත්වීම. |
| ආයුර්වේද කම්කරු | 01 | රු.11,730-10x120- 10x130 - 10x145 - 12x160- රු.17,600 | අටවැනි ශ්‍රේණිය (නවවැනි වසර) සමත්ව තිබිය යුතු ය. |
| පුස්තකාල සහායක | 01 | රු.11,730-10x120- 10x130 - 10x145 - 12x160- රු.17,600 | අ.පො.ස(සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාරයක දී සිංහල/ගණිතය විෂයන්ද ඇතුලුව විෂයයන් 06ක් සමත්වීම. |

02. *අවශ්‍ය වෙනත් සුදුසුකම් :-*

(i) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. (දැනට සේවයේ නියුක්ත අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.).
(ii) අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.
(iii) අයදුම්කරු බදුල්ල මහ නගර සභා බල ප්‍රදේශය තුළ අවුරුදු 03ක ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතුය. (ඡන්ද හිමි නාමලේඛනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතු ය.).
(iv) අයදුම්කරු යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.
(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය.
(vi) බදුල්ල මහ නගර සභාවේ දැනට ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සේවකයින් සම්බන්ධයෙන් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.
(vii) අයදුම්කරුවන් ඒ ඒ තනතුර ඉදිරියෙන් දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

03. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :-*

(i) මෙම තනතුරු ස්ථිරය.
(ii) දායක විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු ය.
(iii) පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වන්නේය.
(iv) මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, රජය හෝ පළාත් සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලු සේවකයින් බැඳී සිටිය යුතු ය.

04. *බඳවා ගැනීමේ ක්‍රමය :-*

I. අවශ්‍යතාව අනුව ලිඛිත/ව්‍යුහගත/ප්‍රායෝගික හෝ සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසු අය තෝරා ගැනේ.
II. අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළයුතු ය.

(i) උප්පැන්න සහතිකය ;
(ii) අධ්‍යාපන සහතික ;
(iii) පදිංචිය සහතික කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය ;
(iv) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්;
(v) වෘත්තීය හෝ පළපුරුද්ද පිළිබඳ සහතිකයක් තිබේ නම් එම සහතිකය.

05. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

06. *අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2011.08.10 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "නාගරික කොමසාරිස්, මහ නගර සභාව, බදුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවර අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ සම්පූර්ණ බලතල බදුල්ල මහ නගර සභාවේ කොමසාරිස් සතුය.

ජී. ඩබ්. සී. එස්. ප්‍රියභාෂිණී,
නාගරික කොමසාරිස්,
බදුල්ල.

2011 ක් වූ ජූලි මස 20 වැනි දින,
බදුල්ල මහ නගර සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**බදුල්ල මහ නගර සභාව**

***පහත තනතුරු සඳහා අයදුම්පත්‍රය***

***මාර්ග කම්කරු/සෞඛ්‍ය කම්කරු/විදුලි කම්කරු/ආරක්ෂක නිලධාරි/ආයුර්වේද කම්කරු/ පුස්තකාල සහායක***

01. අයදුම්කරුගේ නම (මුලකුරු සමග) :——————.
මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————.
02. තැපැල් ලිපිනය :——————.
03. උපන් දිනය : වර්ෂය :——————, මාසය :——————, දිනය :——————.
04. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු :——————, මාස :——————, දින :——————.
05. විවාහක/අවිවාහක බව :——————.
06. ජාතිය :——————.
07. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද ? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචිවීමෙන් ද? යන වග :——————.
08. අධ්‍යාපන සුදුසුකම් :——————.
09. වෘත්තීය සුදුසුකම් :——————.
10. ඔබ දැනටමත් මහ නගර සභාවේ සේවය කරන්නේ නම් :

(i) දැනට දරන තනතුර :——————.
(ii) එම තනතුරට පත්වූ දිනය :——————.
(iii) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත ද? ) :——————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි ඒවා බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය ඒවා හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බවත් දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

08-128

---

**මාතර මහ නගර සභාව**

මාතර මහ නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මාතර මහ නගර සභා බල ප්‍රදේශය තුළ පදිංචි පහත සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *මාසික වැටුප් පරිමාණය* | *අධ්‍යාපන සුදුසුකම් ක්‍රමය* |
|---|---|---|---|
| 01 පුස්තකාල සහායක | 01 | රා.ප.ච. 6/2006(iv)<br>PL 1-2006A<br>රු.11,730-10x120- 10x130 - 10x145 - 12x160- රු.17,600<br>(12 පියවර) | අවම වශයෙන් අටවැනි ශ්‍රේණිය සමත්වී තිබීම. |

| අනු අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් පරිමාණය (මාසික) | අධ්‍යාපන සුදුසුකම් ක්‍රමය |
|---|---|---|---|---|
| 02. | මාර්ග කම්කරු III ශ්‍රේණිය | 03 | රු.11,730-10x120- 10x130 - 10x145 - 12x160- රු.17,600 | අවම වශයෙන් 05 ශ්‍රේණිය සමත් වී තිබීම. |
| 03. | සෞඛ්‍ය කම්කරු III ශ්‍රේණිය | 05 | රු.11,730-10x120- 10x130 - 10x145 - 12x160- රු.17,600 | අවම වශයෙන් 05 ශ්‍රේණිය/06 ශ්‍රේණිය සමත් වී තිබීම. |
| 04. | කාර්යාල කාර්ය සහායක | 01 | රු.11,730-10x120- 10x130 - 10x145 - 12x160- රු.17,600 (12 වැනි පියවර) | අවම වශයෙන් 08 ශ්‍රේණිය/09 ශ්‍රේණිය සමත් වී තිබීම. |
| 05. | පින්තාරුකරු | 01 | PL-2- 2006 (12 පියවර) B655-145x14 15,685 (ප්‍රාථමික මට්ටම ශිල්පීය අර්ධ) | අවම වශයෙන් 5 ශ්‍රේණිය සමත්වීම හා අදාළ ක්ෂේත්‍රයේ යටත් පිරිසෙයින් එක් වසරක පළපුරුද්ද තිබීම. |
| 06. | වාහන පාලිකා | 03 | PL-01-2006 පියවර 22- රු.11,730-10x120- 10x130 - 10x145 - 12x160- රු.17,600 | අවම වශයෙන් 08 වැනි ශ්‍රේණිය සමත් වී තිබීම. |
| 07. | ආයුර්වේද ඖෂධ සංයෝජක | 01 | PL-01-2006 පියවර 22- රු.14,375-145x10- රු.15,680 | ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස. සා. පෙළ විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී එක්වර විෂයයන් පහකින් සමත්ව,අංක ගණිතය/ශුද්ධ ගණිතය/වානිජ අංක ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතුයි ; නැතහොත් ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර විභාගයෙන් එකම වතාවක දී ගණිතය, සිංහල/දෙමළ ඇතුළුව විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතුයි. |
| 08. | ගෝ ඝාතක ස්ථාන භාරකරු | 01 | රු.11,730-10x120- 10x130 - 10x145 - 12x160- රු.17,600 | අවම වශයෙන් 08 ශ්‍රේණිය සමත් වීම. |

01. *පොදු සුදුසුකම් :-*

(i) අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතුයි.
(ii) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍යයකින් යුක්ත විය යුතුයි.
(iii) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18 ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුයි.
(iv) අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවකු නොවිය යුතුයි.

02. *බඳවාගැනීමේ ක්‍රමය:*

(i) සම්මුඛ පරීක්ෂණයකින් පසුව තෝරාගනු ලැබේ.
(ii) නියමිත සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

03. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :-*

(i) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(ii) වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලට දායකත්වය හිමි වේ.
(iii) පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.
(iv) මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, රජයේ හෝ දකුණු පළාත් සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හෝ නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතුය.

04. *ඉල්ලුම් කළ යුතු ආකාරය* :– අයදුම්කරු මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කරන ලද අයදුම්පතක් 2011.09.05 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ නාගරික කොමසාරිස්, මහා නගර සභාව, මාතර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ ඉල්ලන තනතුරේ නාමය සඳහන් කළ යුතුයි. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල මාතර මහ නගර සභාවේ නාගරික කොමසාරිස් සතු වේ.

අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් ඇමිණිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුයි :-

01. උප්පැන්න සහතිකය,
02. අධ්‍යාපන සහතික,
03. පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය,
04. මෑතක දී ලබාගත් ග්‍රාමසේවා සහතිකය,
05. මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්,
06. පළපුරුද්ද පිළිබඳ සහතික.

ආර්. කේ. ආර්. ආර්. රණවීර,
නාගරික කොමසාරිස්,
මාතර මහ නගර සභාව,
මාතර.

2011 ජූලි මස 13 වැනි දින,
මාතර මහ නගර සභාව,
මාතර.

ආදර්ශ අයදුම්පත්‍රය

**....................................... තනතුර සඳහා අයදුම්පත්‍රය**

01. (i) අයදුම්කරුගේ නම (මුලකුරු සමග) :——————.
(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————.
02. තැපැල් ලිපිනය :——————.
03. උපන් දිනය : වර්ෂය :——————, මාසය :——————, දිනය :——————.
04. ජාතික හැඳුනුම්පත් අංකය :——————.
05. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු :——————, මාස :——————, දින :——————.
06. ස්ත්‍රීපුරුෂ භාවය :——————.
07. විවාහක/අවිවාහක බව :——————.
08. ජාතිය :——————.
09. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද ? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද? යන වග :——————.
10. අධ්‍යාපන සුදුසුකම් :——————.
11. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :——————.

12. මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදි වූත් ඒවා මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බවත් දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

08-119

# පළාත් පාලන නිවේදන

**මහරගම නගර සභාව**

නගර සභා ආඥාපනතේ (255 වන අධිකාරය) 50 හා 52 වැනි වගන්ති ප්‍රකාර කරනු ලබන දැන්වීම

නගර සභා ආඥාපනතේ 255 වැනි අධිකාරියේ 50 හි 52 වැනි වගන්ති ප්‍රකාර බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහරගම නගර සභා සීමාවේ පිහිටි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් මහරගම නගර සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට මහ සභාව තීරණය කර ඇත.

02. මේ පිළිබඳව පොදු ජනතාව හෝ අදාළ දේපළ හිමියන් විසින් විරුද්ධත්වයක් දක්වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින සිට එක් මාසයක් ඇතුළත ලිඛිතව ඉදිරිපත් කළ යුතුය.

03. මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් මෙම උපලේඛනයේ සඳහන් පාරවල් මහරගම නගර සභාව සතු පාරවල් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

කාන්ති කොඩිකාර,
සභාපති,
මහරගම නගර සභාව.

2011 ජූලි මස 06 වැනි දින,
මහරගම නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *පාරේ නම* | *විස්තරය* | *ආරම්භය* | *අවසානය* | *දිග* | *පළල* |
|---|---|---|---|---|---|
| මහරගම පමුණුව දේවාල පාර ඉදිරිපිට වමට හැරුණ විට හමුවන ව.අ.217 සිට 225 දක්වා වූ අතුරු මාර්ගය | එම්.එම්. සේනක ප්‍රනාන්දු මිනින්දෝරු තැන විසින් සකසන ලද 2010.08.10 දිනැති හා අංක 2171 ඒ මගින් දැක්වෙන මාර්ගය | මහරගම පමුණුව පාර වරිපනම් අංක 225 | 217/4, 221/7 | මාර්ගයේ මුළු දිගෙන් (අඩි 494'-4") ක් කේ.ඒ.එන්. රණවීර මහත්මියගේ ඉඩමේ උතුරු මායිමට ඇති මාර්ග කොටස හැර ඉතිරි කොටස | 10-15 |

08-85

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### * ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | වාර්ෂික දායක මුදල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශේෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොළස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිළ රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2011** | | | |
| අගෝස්තු | 2011.08.05 | සිකුරාදා | 2011.07.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.08.12 | සිකුරාදා | 2011.07.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.08.19 | සිකුරාදා | 2011.08.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.08.26 | සිකුරාදා | 2011.08.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| සැප්තැම්බර් | 2011.09.02 | සිකුරාදා | 2011.08.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.09.09 | සිකුරාදා | 2011.08.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.09.16 | සිකුරාදා | 2011.09.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.09.23 | සිකුරාදා | 2011.09.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.09.30 | සිකුරාදා | 2011.09.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| ඔක්තෝබර් | 2011.10.07 | සිකුරාදා | 2011.09.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.10.14 | සිකුරාදා | 2011.09.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.10.21 | සිකුරාදා | 2011.10.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.10.28 | සිකුරාදා | 2011.10.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.